# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>2171635<br>Po.Box No | 10120 | | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011- |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1506/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 24/09/2024<br>පැය 0530 |

# මාධ්‍ය නිවේදනය

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බේරුවල පොලිස් ස්ථානය.**

2024.09.23 වන දින සවස් කාලයේ බේරුවල පොලිස් වසමේ මාගල්කන්ද ප්‍රදේශයේදී බේරුවල පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 303 මිලිග්‍රෑම් 500 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන මීනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බේරුවල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශය.**

2024.09.23 වන දින සවස් කාලයේ ගල්කිස්ස පොලිස් වසමේ බඩෝවිට ප්‍රදේශයේදී ගල්කිස්ස කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ගල්කිස්ස පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 54 ක් වන ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

ගල්කිස්ස පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 03. පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි හිමිනමක් ඇතුළු සැකකරුවන් 09 දෙනෙකු අත්අඩංගුවට - වේයන්ගොඩ පොලිස් ස්ථානය.

ඉදිවෙමින් පවතින මධ්‍යම අධිවේදී මාර්ගය කැණීම් කර අනර්ථය සිදුකරන බවට 2024.09.20 වන දින වේයන්ගොඩ පොලිස් ස්ථානය වෙත කරන ලද පැමිණිල්ලක් මත වඳුරව ප්‍රදේශයේදී වේයන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් 2024.09.20 වන දින වැටලීමක් සිදුකර **එස්කැවේටර් යන්ත්‍රයක් උපයෝගී කර ගනිමින් පුරාවස්තු ලබාගැනීමේ අරමුණින් කැණීම් කරමින් සිටි හිමිනමක් ඇතුළු සැකකරුවන් 09 දෙනෙකු ඔවුන් පැමිණි කාර් රථයක් සහ ත්‍රිරෝද රථයක් සමඟ** අත්අඩංගුවට ගෙන ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාර හිමිනම වයස අවුරුදු 26 ක් වන වේයන්ගොඩ ප්‍රදේශයේ විහාරස්ථානයක වැඩ වාසය කරන අතර, අනෙක් සැකකරුවන් අවුරුදු 30 ත් 58 ත් අතර වයස්වල පසුවන ආණමඩුව, සූරියවැව, ඇඹිලිපිටිය, මිනුවන්ගොඩ හා වේයන්ගොඩ ප්‍රදේශවල පදිංචිකරුවන් වේ.**

වේයන්ගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සොයා ගැනීම - මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය.

ජාත්‍යන්තර පොලිසිය මගින් රතු වරෙන්තු නිකුත් කර 2024.08.29 වන දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙරටට රැගෙන එන ලද සැකකරුවෙකුගෙන් අනාවරණය වූ තොරතුරු මත 2024.09.22 වන දින සවස් කාලයේ මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් මතුගම පොලිස් වසමේ යටදොල ප්‍රදේශයේදී වැටලීමක් සිදුකර **විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක්, එම පතරොම් ගැබක් හා එම පතරොම් 05 ක්** සොයා ගෙන ඇත.

මනුෂ්‍ය ඝාතන හා සංවිධානාත්මක අපරාධ විමර්ශන අංශය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 05. මෘත ශරීරයක් හමුවීම - බුත්තල පොලිස් වසම.

2024.09.23 වන දින උදෑසන කාලයේ බුත්තල පොලිස් වසමේ අඹකොළවැව ප්‍රදේශයේ පුද්ගලයෙකු අතුරුදහන්ව ඇති බවත් එම ප්‍රදේශයේ පිහිටි වගා ළිඳක අතුරුදහන්වූ පුද්ගලයාගේ බවට සැකකරන පාවහන් යුගලක් ඇති බවටත් එම බුත්තල පොලිසියට ලද පැමිණිල්ලක් මත බුත්තල පොලිසිය විමර්ශන ආරම්භ කර ඇත. අනතුරුව සිදුකළ විමර්ශනයේදී අතුරුදහන් වූ පුද්ගලයාගේ මෘත ශරීරය එම වගා ළිඳ තුල තිබී හමු වී ඇත.

**මරණකරු වයස අවුරුදු 47 ක් වූ උනාවටුන, බුත්තල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් හදිසි මරණ පරීක්ෂණය සිදුකර වැල්ලවාය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. බුත්තල පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. හදිසි ගින්නක් - මොණරාගල පොලිස් වසම.

2024.09.23 වන දින සවස් කාලයේ මොණරාගල පොලිස් වසමේ කොලොන්වින්න ප්‍රදේශයේ ඉඩමක හදිසි ගින්නක් හට ගෙන ඇති බවට මොණරාගල පොලිසියට ලද පණිවිඩයක් මත වහාම ක්‍රියාත්මක වූ පොලිස් නිලධාරීන්, ආපදා කලමණාකරණ නිලධාරීන්, වන සංරක්ෂණ නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් එක්ව ගින්න මැඩ පවත්වා ඇත.

ගින්න හේතුවෙන් ජීවිත හානි සිදුව නොමැති අතර, අක්කර 04 ක පමණ භූමියක් විනාශ වී ඇත. මොණරාගල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**